# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2018 නොවැම්බර් මස 05 වන දින (සඳුදා) පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන
II. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා
III. ලිපිලේඛන පිළිගැන්වීම
IV. කාරක සභා වාර්තා පිළිගැන්වීම.
V. පෙත්සම්
VI. ප්‍රශ්න / අතුරු ප්‍රශ්න

<u>සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න</u>

01. ගරු උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.10.09 වන දින සභාව කල්තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්නය,

[ප්‍ර/VI(1)/18/ADG - 06]

අ. බස්නාහිර පළාතේ දැනට ගුරු සේවයේ පුරප්පාඩු කීයක් තිබේද?

ආ. පත්වීම් නොලබා සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ පිරිස කොපමණද?

ඇ. 2014.08.08 ගැසට් නිවේදනය යටතේ පැවැත් වූ තරඟ විභාගයෙන් කී දෙනෙක් බඳවා ගෙන තිබේද?

ඈ. 2007 හා 2011 ලකුණු 80 ලබා ගත් සියලු දෙනාටම පත්වීම් ලබා දුන්නේ නම් 2014 විභාගය පවත්වා වසර 4 කට ආසන්න කාලයක් තුළ මෙම පත්වීම් ලබා නොදීමට හේතුව කුමක්ද?

ඉ. බස්නාහිර පළාත තුළ 3000කට අධික ප්‍රමාණයක ගුරු හිඟයක් පවතීද?

ඊ. එම හිඟයට මෙම පත්වීම් ලබා දිය නොහැකි ද? (සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයට)

උ. 2018.07.23 සිට 2018.07.31 දක්වා පැවති සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අය සඳහා පත්වීම් ලබා දෙන්නේ ද?

ඌ. 2014.12.27 වන දින සම්මුඛ පරීක්ෂණය සඳහා මුහුණ දුන් උපාධිධාරීන් හට පත්වීම් ලබා දීමට කටයුතු සිදු කරන්නේ ද?

**02.** ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.10.23 වන දින අසන ලද ප්‍රශ්නය, [ප්‍ර/VI(1)/18/65]

අ. පසුගිය දිනවල අනුමත කරන ලද පරිපූරක ඇස්තමේන්තු මඟින් අධ්‍යාපන අමාත්‍යාංශ විෂයයන්ට අදාල වැඩ,

(i) අනුමත කල ටෙන්ඩර් පටිපාටිය,

(ii) ටෙන්ඩර් සඳහා අයදුම් කල අය,

(iii) ටෙන්ඩර් වලට අනුව තෝරා ගත් අය,

(iv) තෝරා ගත් අයට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට හේතු,

(v) ඇස්තමේන්තු මුදල.

(vi) ටෙන්ඩරය ප්‍රදානය කළ මුදල.

පිළිබඳ වාර්තාවක් ලබා දෙන්නේද?

ආ. තවමත් ටෙන්ඩර් ප්‍රදානය නොකළ ව්‍යාපෘති මොනවාද?

ඇ. ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව සිදු කරන ව්‍යාපෘති තිබේද? ඒ මොනවාද?

**03.** ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.10.23 වන දින අසන ලද ප්‍රශ්නය, [ප්‍ර/VI(1)/18/67]

අ. සී/ස පිළියන්දල බෝකුන්දර විවිධ සේවා සමුපකාර සමිතියේ වර්තමාන පාලනය යටතේ සිදු කරන ලදැයි කියන මුදල් වංචා, දූෂණ, අක්‍රමිකතා ගැන ඔබතුමාට, ඔබ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වෙත පැමිණිලි ලැබී තිබේද?

ආ. පැමිණිලි ඉදිරිපත් කළ අය කවුරුන්ද?

ඇ. චෝදනා කවරේද?

ඈ. ඒ පිළිබඳව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද?

ඉ. ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, හේතු කවරේද?

සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න*

**04.** ගරු සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.10.23 වන දින සභාව කල් තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්නය,* [ප්‍ර/VI(1)/18/ ADG - 07]

(අ) 2017 හා 2018 වසර දෙකේදී පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඩෙංගු මර්ධන වැඩසටහන්වලට කොන්ත්‍රාත් පදනමින් කොපමණ පිරිසක් (දිස්ත්‍රික්ක වශයෙන්) බඳවා ගත්තේද?

(ආ) ඔවුන්ගෙන් දැනට ස්ථිර පත්වීම් ලබා ඇති පිරිස කොපමණද? ස්ථිර නොකල පිරිස කොපමණද?

(ඇ) ඔවුන්ගේ නාම ලේඛණ (දිස්ත්‍රික්ක වශයෙන්) සභාගත කරන්නේද? නොඑසේනම් ඒ මන්ද?

(ඈ) 2017 හා 2018 වසරවල මෙතෙක් සෙසු රෝහල් කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා කොපමණ සේවක පිරිසක් බඳවාගෙන තිබේද? නම් හා තනතුරු ලේඛණ සභාගත කල හැකිද?

(ඉ) 2017 හා 2018 වසරවල මෙතෙක් පළාතේ ආයුර්වේද රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල සේවය සඳහා බඳවාගත් තාවකාලික හා ස්ථිර පත්වීම් සංඛ්‍යා හා නාම ලේඛණ (දිස්ත්‍රික්ක වශයෙන්) සභාගත කරන්නේද? නොඑසේනම් මන්ද?

05. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; [ප්‍ර/VI(1)/18/70]

(අ) අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිට්ටඹුව - මීගමු පාර අංක 8,14,26 දරණ නිවෙස්වල පදිංචි අය නගරය අලංකාර කිරීමට බව පවසා ඉවත් කිරීමට යන බව ඔබතුමා දන්නෙහිද?

(ආ) එකී ඉඩම්වල එම පිරිස අවුරුදු 50 වත් අධික කාලයක් සිට පදිංචි වී සිටින බව ඔබතුමා පිළිගන්නෙහිද?

(ඇ) එකී ඉඩමේ අයිතිකරු ලෙස පෙනී සිටින නිට්ටඹුව, බටදොලේ අංක 127 දරණ ස්ථානයේ පදිංචි සොන්ඩාල් අබේසේකර නැමැති අයට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් ඉහත පදිංචි පිරිස ඉවත් කරගන්නා ලෙස ලිපි මඟින් දැනුම් දී ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ඈ) ඉතා දීර්ඝ කාලයක් ඉහත නිවාසවල පදිංචි අය සඳහා සාධාරණය ඉටුකර දීමට ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද?

(ඉ) නොඑසේනම් ඒ මන්ද?

06. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; [ප්‍ර/VI(1)/18/71]

(අ) මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ මීරිගම කොට්ඨාසයේ අංක 3 දෙල්වල ග්‍රාම නිලධාරි වසමේ කලගහවත්ත හෙවත් ඊටිගහවත්ත නමැති ඉඩමක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතුව තිබේද?යන්න සභාවට දන්වන්නෙහිද?

(ආ) තිබේ නම් එකී ඉඩමේ මුල් අයිතිකරුවන් කවුරුන්ද?

(ඇ) එම ඉඩම කුමන පදනමක් යටතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා දී ඇත් ද යන්නත්, මේ වන විට ඉඩමේ භාරකාරත්වය දරන්නේ කවුරුන්ද?යන්නත් සභාවට දන්වන්නෙහි ද?

(ඈ) මේ වන විට එකී ඉඩමේ වාර්ෂික බදු පදනමක් යටතේ හෝ එළදාව රැස් කිරීම පදනම යටතේ බදු දී ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ බදු දී ඇත්තේ කාටද?යන්නත්, අවසන් වරට බදු දී ඇති මුදල හා අදාළ අය තෝරා ගැනීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය කළේද?යන්න සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම් මන්ද?

07. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

[ප්‍ර/VI(1)/18/72]

(අ) අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ මීරිගම කොට්ඨාසයේ අංක 3 දෙල්වල ග්‍රාම නිලධාරි වසමේ කලගහවත්ත හෙවත් ඊට්ටිගහවත්ත නමැති ඉඩම පවරා දීමට අදාළ කටයුත්තට බාහිර, කටයුතු සඳහා, භාවිතා කරන බව ඔබතුමා දන්නෙහිද?

(ආ) එකී ඉඩම මුල් අයිතිකරුට පවරා දීමට තීරණය කර ඇත් ද? යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ වන විට එකී ඉඩමෙන් පෞද්ගලික පරිහරණය සඳහා පාරක් කපා ඇති බවත්, ඉඩමේ මායිමෙන් ගලා බසින ඔය රක්ෂිතයට හානිවන පරිදි පෞද්ගලික අවශ්‍යතාවය සඳහා ස්ථිර පාලමක් ඉදිකර ඇති බවත්, ඔබතුමා දන්නෙහිද?

(ඈ) ඒ සඳහා අවසරය ලබාදුන්නේ කවුරුන්ද? යන්න සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේනම් ඒ මන්ද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

X. සභාවේ රැස්වීම්

## සභාවේ රැස්වීම් (I)

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව : "අද දින (2018.11.05 දින) විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව 2018.11.19 දින (සඳුදා දින) පෙ.ව. 9.30 ට රැස්විය යුතු අතර, 2018.11.20 දිනය (අඟහරුවාදා දිනය) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සළකා ක්‍රියා කළ යුතුය."

## සභාවේ රැස්වීම් (II)

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව : "2018.10.23 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී, එකඟතාවය පළකල පරිදි, 2018 නොවැම්බර් 19 දින, 2018 දෙසැම්බර් 04,05,06,07, 10 හා 11 යන දිනයන්, 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතුය."

# XI. සභාවේ කටයුතු

## සභාවේ කටයුතු (I)

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව : "අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ අංක 01 හා 02 හි සඳහන් වැඩ කටයුතු සඳහා රීති අංක 39 (1) හා 52 (5) හි සඳහන් විධි විධානයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතු යැයි සළකා ක්‍රියා කළ යුතුය."

## සභාවේ කටයුතු (II)

ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව : " 2018.10.23 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ලද එකඟතාවයට අනුව, කාර්යපටිපාටි රීති අංක 39(4) හා 53(3) හි විධිවිධානයන් කෙරෙහි තැකීමකින් තොරව, අද දිනට (2018.11.05 දිනට) නියමිත න්‍යාය පත්‍රයේ අංක XIII පෞද්ගලික මන්ත්‍රී කටයුතු විෂයය යටතේ ඇතුලත් කාර්යයන්හි අනුපිළිවෙල, පිළිවෙලින් කාර්ය අංක 02 හා 01 වන පරිදි වියයුතු යැයි සළකා ක්‍රියා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි."

# XII. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.) :

යෝජනාව :

2018 පරිපූරක ඇස්තමේන්තුව - 03

2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ ආයතනවල මතු දැක්වෙන අ වශ්‍යතා වෙනුවෙන් අමතර ප්‍රතිපාදන සලසාදීම සඳහා එනම්,

- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
  - i. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නව බඳවා ගැනීම්, උසස් කිරීම් හා ස්ථාන මාරු වී පැමිණීම් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීමට 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන - රු. 729,247,000/-
  - ii. උසස්වීම් හා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව වැඩි වූ රේටයන් අනුව අතිකාල ගෙවීම් කිරීමට 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන - රු.715,145,000/-

- ආයුර්වේද දෙපාර්තමේන්තුව
    i. ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නව බඳවා ගැනීම් සහ ස්ථාන මාරුවීම් සඳහා වැටුප්, දීමනා හා විදුලි සංදේශ සේවා වෙනුවෙන් 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන - රු. 63,034,000/-

- අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
    i. පාසල් අධ්‍යාපනය දැනුමේ කේන්ද්‍රස්ථානයේ පදනම බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රජයෙන් ලද ප්‍රදාන වියදම් දැරීම වෙනුවෙන් 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන - රු. 21,000,000/-

- ඉංජිනේරු කාර්යාංශය :
    i. නව බඳවා ගැනීම් සඳහා වැටුප්, දීමනා ගෙවීමට හා හිඟ වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම. - රු. 15,493,000/-
    ii. පරිපූරක ඇස්තමේන්තු යෝජනා අනුව ඉටු කළ යුතු ඉදිකිරීම් කටයුතුවල අතිරේකව විශාල වැඩ කොටසක් ඉටුකිරීමට සිදු වීම නිසා ප්‍රාදේශීය ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරීන් සඳහා අමතර නිවාඩු දින වැටුප් ගෙවීමට සිදු වීම. - රු. 9,855,000/-

රු. 1,553,774,000/-

යනාදි අවශ්‍යතා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, ඒ සඳහා වූ 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 සඳහා අවශ්‍ය රුපියල් එක් බිලියන පන්සිය පනස්තුන් මිලියන හත්සිය හැත්තෑ හතර දහසක්(රු. 1,553,774,000/-ක්) වන ප්‍රතිපාදනය:

| | | |
|---|---|---|
| i. | පළාත් සභා ආදායමින් | - රු. 350,000,000/- |
| ii. | පාසල් අධ්‍යාපනය දැනුමේ කේන්ද්‍රස්ථානයේ පදනම බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා දැනටමත් රජයෙන් ලැබී ඇති ප්‍රදාන | - රු. 21,000,000/- |
| iii. | රජයෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රදාන | - රු. 1,182,774,000/- |
| | | රු. 1,553,774,000/- |

වන පරිදි පියවා ගැනීමට අපේක්ෂිත වන අතර, ඉහත කී රජයෙන් ලබාගැනීමට අපේක්ෂිත ප්‍රදාන ලෙස සඳහන් රු. 1182,774,000/- ක් වූ ප්‍රදානය ලබාදීම පිළිබඳව එකඟතාව අපේක්ෂාවෙන් යුතුව මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන අතර, ඉහත සඳහන් සියළු කාරණා අනුව පිළියෙල කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 අනුමත කළ යුතුය."

02. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.):

යෝජනාව :

<u>2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 ට අදාල විසර්ජන ප්‍රඥප්තිය</u>

" 2018 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තු - 03 සඳහා අවශ්‍ය රුපියල් එක් බිලියන පන්සිය පනස්තුන් මිලියන හත්සිය හැත්තෑ හතර දහසක් (රු. 1,553,774,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාරගැනීමටත් බලය දෙනු ලබන 2017 අංක ----------- දරණ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය."

## XIII. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

(සභාවේ කටයුතු - II යෝජනාව අනුව පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු විෂයයේ කාර්යයන්හි අනුපිළිවෙල වෙනස් වීමට ඉඩ ඇත.)

01. <u>ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා</u>:

" බස්නාහිර පළාතේ ග්‍රාමීය පාසල් වල ඉගෙනුම ලබන දරුවන්ට අද ප්‍රවාහන අපහසුතා දැඩි ලෙස බලපාන බව සියළු දෙනා දන්නා කරුණකි. ඒ හේතුවෙන් පාසල් වෑන් සංස්කෘතියක් බිහි වී ඇත. ආර්ථික අපහසුතාවය සැලකිල්ලට ගෙන පාසල් සිසුන්ගේ ප්‍රවාහන අපහසුතාවය නැති කිරීම සඳහාත් නිරෝගී දරු පිරිසක් බිහි කිරීම සඳහාත්, 8 වසර පංතියෙන් ඉහළ ළමයින්ට පා පාපැදියක් ලබා දීම සුදුසුයැයි ද, ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දෙන උපමාන පාදක අරමුදල් මගින් යම් ප්‍රතිශතයකට යටත්ව ප්‍රතිපාදන වෙන් කිරීමට අවස්ථාව සලසා දීම සුදුසු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කර සිටියි."

[යෝ/VI(1)/18/07]

**02.** <u>ගරු අජන්ත නිරෝෂන් පාදුක්ක මන්ත්‍රීතුමා:</u>

"ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීම පෞද්ගලික අංශයේ ආයතන විසින් ඉතා සූක්ෂම ලෙස බස්නාහිර පළාත ඇතුලත හා දිවයින පුරාම ක්‍රියාත්මක වේ.

කණ්ඩායම් ණය සහ පෞද්ගලික ණය 40% වාර්ෂික පොලිය මත අය කර ගනියි. එය දැඩි අසාධාරණ සූරා කෑමකි. මෙම ණය ක්‍රමවේදය සම්බන්ධව මහ බැංකුවේ අධීක්ෂණය දැනට ප්‍රමාණවත් නොවන බැවින් මෙම තත්වය පිළිබඳව දැඩි අවධානය යොමු කොට මෙවැනි ණය ක්‍රම විධිමත් කිරීම සඳහා නව නීති, රෙගුලාසි කඩිනමින් සකස් කර ක්‍රියාත්මක කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව, මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ඉල්ලා සිටියි."

[යෝ/VI(1)/18/08]

## XIV. සභාව කල් තැබීම.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.10.23 දින.

සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
11 වන මහල,
බස්නාහිර පළාත් සභා කාර්යාල සංකීර්ණ නව ගොඩනැගිල්ල,
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
ශ්‍රී ජයවර්ධනපුර,
බත්තරමුල්ල.